## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අංශය

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා නිලධාරින් පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය

අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරේ පුරප්පාඩු 01 ක් පවතින අතර, එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ **I පන්තියේ I ශ්‍රේණියේ** නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019.09.12 දිනැතිව නිකුත් කරනු ලැබූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2019 හි ඇමුණුම 02 අනුව සකස් කරනු ලැබූ අයදුම් පත්‍රයක් **2024.02.15** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත යොමු කරන ලිපි කවරයෙහි වම්පස ඉහල කෙලවරේ (**"අධ්‍යක්ෂ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ " සඳහා ඉල්ලුම්පත**) ලෙස සඳහන් කල යුතුය.

අයදුම්පත් එවිය යුතු ලිපිනය - අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අංශය
නො.18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2050/43 හා 2017.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශනයට පත් කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරට පත් කරනු ලැබේ.

04. එම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ විස්තරාත්මක ලකුණු පටිපාටිය

| | පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | <u>සේවා පළපුරුද්ද - 60</u><br>I. තනතුරට අදාල ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය වසරක් සඳහා ලකුණු 05ක්ද වසරකට අඩු මාස 06කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 02 1/2 ක්ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.<br><br>II. ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතාවයට (නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ ලෙස) අදාල පූර්ව පලපුරුද්ද (උපරිම වසර 05ක් සඳහා) වෙනුවෙන් වසරකට ලකුණු 02 බැගින් ද මාස 06 කට වඩා වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 01 බැගින්ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 50<br><br>10 |

02

<u>කුසලතාවය - 40</u>

**I. අධ්‍යාපන සුදුසුකම්** 15

නිලධාරීන් සේවයට බඳවා ගැනීමේදී සලකා බලනු ලැබූ මූලික සුදුසුකම් වලට අමතරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විශේෂඥතා ක්ෂේත්‍ර වර්ගීකරණයකට අදාල හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරට අදාල වූ අධ්‍යාපන සුදුසුකම් පමණක් සැලකීමට ලක් කරනු ලැබේ.

අ.) පශ්චාත් උපාධිය - ලකුණු 15
ආ.) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 10

- ලබා ඇති ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

**II. වෘත්තීය සුදුසුකම්** 10

(අ) I. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - 10 (දේශීය/විදේශීය)

II. එම ක්ෂේත්‍රයේ මාස 06ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා - 05

(ආ) පහත දක්වා ඇති අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික (Professional Certification) සඳහා කාලසීමාව නොසලකා ඉහත 2 (II) (අ) (i) යටතේ සැලකීමට ලක් කෙරේ.

1) BCS/ACS
2) Microsoft Certifications
3) Sun Certifications
4) Cisco Certifications
5) CISSP Certifications
6) etc...

**III. විශේෂ කාර්යයන්/ දායකත්වයන්** 10

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව සිදු කරන ලද නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

(අ) නව නිර්මාණ, වැඩි දියුණු කිරීම්, ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 05ක් සඳහා ලකුණු 10

උදාහරණ :-
1) මෘදුකාංග නිර්මාණය / සංවර්ධනය (Software Designing / Development)
2) ජාල පරිපාලනය (Network Administration)
3) පද්ධති පරිපාලනය (System Administration)
4) දත්ත පාදම පරිපාලනය (Data Base Administration)
5) සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සහ වෙනත් (General ICT Tasks & etc.)

(ආ) පොදු 230b ආකෘතියෙන් ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම් / ආයතන ප්‍රධානියා විසින් සහතික කල ප්‍රශංසා 01ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ප්‍රශංසා 05ක් සඳහා පමණක් එනම් උපරිම ලකුණු 05ක් පමණක් ලබාදෙනු ලබන අතර අයදුම්කරුවෙකුට ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 05ක් ලබා ගැනීමෙන් පසු ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා මෙම සුදුසුකම යටතේ ලබාදෙන ඉතිරි ලකුණු 05ක් ද ලබා ගත හැකිය.

| | | |
|---|---|---|
| | සැ.යු.<br><br>නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් අයදුම්කරු විසින්ම සිදු කල බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි.<br>❖ ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබා ගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කල යුතුය.<br><br>**IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br><br>ඇ.) නායකත්වය - ලකුණු 02<br>ආ.) සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>ඈ.) වෘත්තීය ආචාරශීලීභාවය - ලකුණු 01 | 05 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

දිනය 2024.02.02

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක. 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.


ලිපිනය :- නො. 18, වෝඩ් පෙදෙස, කොළඹ 07
දුරකථන අංකය:- 0112671355
ෆැක්ස් අංකය :- 0112674770
විද්‍යුත් ලිපිනය :- secretary@mohe.gov.lk

## අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත් කිරීම සඳහා වන අයදුම්පත්‍රය

(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කර යුතුය

1. සම්පූර්ණ නම ......................................................................................................මයා/මිය/මෙය
2. උපන්දිනය ......................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය ......................................................................................................
4. සේවා කාලය

| පන්තිය/ ශ්‍රේණිය | සේවා කාලය |
|---|---|
| 1 පන්තිය I ශ්‍රේණිය | |
| 1 පන්තිය II ශ්‍රේණිය | |
| 1 පන්තිය III ශ්‍රේණිය | |

5. දැනට සේවයේ නියුක්ත තනතුර හා කාර්ය ක්ෂේත්‍රය ................................................
6. අධ්‍යාපන සුදුසුකම්

ලබා ඇති පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිළිබඳ විස්තර

| පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | වර්ෂය | විශ්ව විද්‍යාලය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

7. වෘත්තීය සුදුසුකම් ......................................................................................
8. සම්පූර්ණ කරන ලද විශේෂ කාර්යයන්

| ඉටු කරන ලද සේවය හා විශේෂ කාර්යය/ දායකත්වයන්/ ජයග්‍රහණයන් | විස්තරය | ආයතන ප්‍රධානියාගේ සහතිකය ඇත/නැත |
|---|---|---|
| | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය .................................... ..............................................

අයදුම්කරුගේ අත්සන,

තනතුරු නාමය හා නිලමුද්‍රාව

(ආ) කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතුය.

I. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත/නැත

II. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 තුල වැටුප් වර්ධක උපයා ගෙන ඇත/නැත

III. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 තුල කිසිදු විනය දඩුවමකට ලක් වී ඇත/නැත

IV. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදුවෙමින් පවතී/නොපවතී

V. පූර්වාසන්න වසර 03 තුල ලබා ඇති නිවාඩු තොරතුරු

| අනු අංකය | වර්ෂය | වැටුප් සහිත නිවාඩු | අඩ වැටුප් සහිත නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|---|---|
| | | | | |

ඉහත සඳහන් තොරතුරු නිලධාරියාගේ පුද්ගලික ලිපිගොණුව අනුව නිවැරදි බවත් මෙම නිලධාරියා විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහා නිලධාරියා තෝරා ගතහොත් ඒ සඳහා ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු රහිතව/ සහිතව/ අනුප්‍රාප්තිකයෙකු පසුව ලබා දීමේ පදනම මත මුදා හැරිය හැකි බවත් කාරුණිකව දන්වමි.

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන,

තනතුරු නාමය හා නිලමුද්‍රාව